සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 9 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය පැ. 2 යි. |
|---|---|---|

නම : ......................................................................... පංතිය : .................................. විභාග අංකය :.............

## I කොටස

■ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

✶ පහත එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථය ප්‍රකාශ වන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බොරු පොරොන්දු දී ඇඟිල්ලේ නැටවීමට සමහරු සූර්යයෝ ය.
    1. සිතැඟි ලෙස හසුරුවා ගැනීමට 2. බලපෑම් කිරීමට
    3. තර්ජනය කිරීමට 4. ඉබාගාතේ යැවීමට

02. පොට වරද්දා ගැනීම නිසා ප්‍රශ්නය බැරෑරුම් වූ බව ගුරුතුමා පැහැදිලි කළේ ය.
    1. ලණුවේ අගමුල නොදැනීම 2. නිවැරදි උත්සාහය
    3. වැරදි පිළිතුරු සැපයීම 4. වැරදි පියවරක් ගැනීම

03. වැලේ වැල් නැතිව සිටි තමාට දුන් හොඳ කාලයක් උදා වී ඇති බව එතුමා සිය කථාවේ දී කීවේය.
    1. මහත් දුෂ්කරතා සහිත ව 2. එල්ලීමට ආධාරකයක් ඇති ව
    3. ආර්ථික අමාරුකම් ඇති ව 4. විශාල මුදල් කන්දරාවක් ඇති ව

04. දුම්රිය පළෙහි සිටි මගීහු වදෙන් පොරෙන් උඩරට මැණිකේ දුම්රියට නැග ගත්හ.
    1. අකමැත්තෙන් 2. ඉතා අමාරුවෙන් 3. හදිසියෙන් 4. ඉතා උනන්දුවෙන්

05. තාත්තා හෙට යාමට සූදානම් වන ගමන ගැන මම ඉත්තේරුවෙන් දැන ගත්තෙමි.
    1. වැරදි ලෙස 2. අනුමාන වශයෙන් 3. සම්පූර්ණයෙන් 4. යාන්තමින්

✶ පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.

06. සුනාමි ව්‍යසනයෙන් පසුව ඉක්මනින් ම යථාතත්ත්වයට පත් වීමට හැකි වූයේ ...................................... ආපදා අවස්ථා කෙරේ අවධානය යොමු කිරීම නිසා ය.
    1. පශ්චාත් 2. නූතන 3. පෙර දින 4. පසුදා

07. පැරණි ශාස්ත්‍රීය ග්‍රන්ථ ............................... කිරීමෙන් වටිනා තොරතුරු දැනගත හැකි ය.
    1. ප්‍රතිනිර්මාණය 2. පරිවර්තනය 3. ප්‍රතිනිර්මාණය 4. පරිශීලනය

08. කතරගම මහ පෙරහැර නරඹන විදේශිකයෝ ............................. වෙති.
    1. විශ්මිත 2. විලම්භිත 3. වශීකෘත 4. දොම්නස්

09. මහගම සේකර මහතා අපූර්ව පද ..................................... දේශාභිමානි ගීත රචනා කර ඇත.
    1. සංයෝජනයෙන් 2. සංග්‍රහයෙන් 3. සංස්කරණයෙන් 4. සම්භාවිතයෙන්

10. මෙරට සිටි බොහෝ රජවරු වෙහෙර විහාර ...................... කර බෞද්ධාගමික දියුණුවට කටයුතු කළෝය.
1. ප්‍රවර්ධනය 2. ප්‍රතිසංස්කරණය 3. ප්‍රරෝහණය 4. සංශෝධනය

11. නිෂ්ඵල ක්‍රියාවන් සිදු කිරීම, දුදන ගුණ නොහැරීම යන අරුත් ඇති ප්‍රස්තාව පිරුළ හා ආප්තෝපදේශය ඇතුළත් පිළිතුරු යුගලය වන්නේ,
1. අතුකඩා මොර කන්නා සේ - අවි ගත්තෝ අවියෙන් ම නසිති.
2. අහසට ඉනිමං බැන්දා වගේ - අඟුරු කිරෙන් සේදුවත් සුදු නොවේ.
3. ගඟට ඉනි කැපුවා සේ - පෙරළෙන ගලේ පාසි නොබැඳේ.
4. ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ - දිලිසෙන සියල්ල රන් නොවේ.

12. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
1. ඓන්ද්‍රිය, ඓරාවණ, ඓශ්වර්යය, ඓක්‍යය 2. ජෝතිත, ඥප්ති, ඥානවෘද්ධ, ඥාපන
3. අනුව, අත්‍රෝබ, අක්‍රිය, අක්ෂ 4. නාහල, කකුල, කැවිලි, කිරි

13. එක් එක් වචනවල මුලකුරෙහි ඉස්පිල්ල, පාපිල්ල ගැට ඇලපිල්ල, දීර්ඝ ඇදය අනුපිළිවෙලින් යෙදී ඇති උත්තරය තෝරන්න.
1. කාසිය, නුවණ, කෘදන්ත, නාවල 2. මිහිරි, රුදාව, ක්‍රමය, මූසල
3. කිරීටය, රුය, දාෂ්ටිය, රුවන් 4. සිපිරිගෙය, කුඩය, කෘත්‍රිම, නැඹිලිය

14. අක්ෂර වින්‍යාසට වැරදි ලෙස යොදා ඇති පිළිතුර තෝරන්න.
1. ශ්‍රේෂ්ඨ, පාපිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, උත්කෘෂ්ඨ 2. පරිගණකය, මර්දනය, කරුණාව, පිළිවෙළ
3.. නිශ්චල, ආශ්වාස, නිෂ්පාදන, නිශ්ඵල 4. කොට්ඨාසය, ප්‍රස්තාව පිරුළු, විස්මය, ආභෘෂය

15. මූර්ධජ අක්ෂර පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. ට, ඨ, ඩ, ඪ, ණ 2. ත, ථ, ද, ධ, න 3. ක, ඛ, ග, ඝ, ඞ 4. ප, ඵ, බ, භ, ම

16. අසනිපාතය, කුළු ගැන්වීම යන පදවල අර්ථය පිළිවෙළින් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
1. මහා චෛතිය - මිටි පහර දීම 2. හෙණ ගැසීම - මතු කිරීම
3. සුළු කුණාටුව - ආරම්භ වීම 4. රෝගාබාධය - කුල්ලෙන් පෙළීම

17. උපසර්ග පදයක් ඇතුළත් නොවන පිළිතුර වන්නේ,
1. සුරත්, දුසිරිත්, ප්‍රබල 2. අසෝෂ, අවනම්බු, නිසරු
3. නිදොස්, නුහුරු, නිශ්චල 4. කුදිටු, විරාග, අසිරි

18. උක්ත නාම පද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් යෙදී ඇති වරණය තෝරන්න.
1. තෝ, මිනිසෙකු, ඔවුහු, යුෂ්මතුන් 2. අප, මම, මවක්, අයෙක්
3. ඔබ, ඔහු, ගැහැනියක්, ඇය 4. වෙළෙන්දෙක්, රැජිනක්, කෙනෙක්, ඈ

19. නිත්‍ය බහුවචන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ගායිකාවන්, සතුන්, මිනිසෙක් 2. ළමයි, ලේඛකයෝ, මැණියෝ
3. සමහර, ඇතමෙක්, අයෙක් 4. හෙතෙම, ඔවුහු, ඇය

20. යම්කිසි දෙයක සැබෑ තත්ත්වය ප්‍රකාශ කිරීම,
1. අතිශයෝක්තිය 2. ස්වභාවෝක්තිය 3. පුනරෝක්තිය 4. ව්‍යංගාර්ථය

21. ප්‍රථම පුරුෂ ක්‍රියාපද සමඟ යෙදෙන නාමපද වන්නේ,
1. ළමයා, ඔහු, ඔබ 2. ඔහු, ඇය, ළමයා 3. ඇය, මම, ඔහු 4. ළමයා, ඔබ, ඇය

22. ''සුගුණපාල ගුරුතුමා සිරිසෝම දෙස ගෞරවයෙන් බලා සිටියේ ය.''
ඉහත වාක්‍යයේ ඇති නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද වන්නේ,
1. ගුරුතුමා - සිටියේ ය.
2. සිරිසෝම - බලා
3. සුගුණපාල - ගෞරවයෙන්
4. දෙස - සිටියේ ය.

23. මුලින් දී ඇති පදයට සමානාර්ථ නොදෙන පදයක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. සිංහයා - කෙසරිඳු, බාසුරු, මිහිඳු, ගිජිඳු
2. පියුම් - පද්ම, කමල, සියපත, අරවින්ද
3. අම්මා - මව, මාතා, මෑණි, මෝ
4. සොම්නස - ප්‍රහර්ෂය, අමන්දානන්දය, කුට, තොස

24. මුලින් දී ඇති පදයෙහි විරුද්ධාර්ථ නොදෙන පද ඇතුළත් පිළිතුර වන්නේ,
1. සුලබ - බොහෝ, වැඩි, අධික, බහුල
2. ගුණ - නරගුණ, අවගුණ, නුගුණ, අගුණ
3. ආකුළ- අනුකුළ, නිරාකුළ, ව්‍යාකුළ, අනාකුළ
4. මිතුරු - පිළිමල්, විරුදු, අමිතුරු, සතුරු

25. ''කොළ මුහුද' ලෙස ධීවරයා දකින්නේ,
1. වෙරළේ සිට සැතපුම් භාගයක් පමණ විහිදී යන මුහුදයි.
2. ඈත මුහුදේ සිට සැතපුමක් පමණ දුරට විහිදී යන නොගැඹුරු මුහුදයි.
3. ............... මුහුදේ සිට සැතපුමක් පමණ දුරට විහිදී යන මුහදයි
4. නිල් මුහුදේ සිට සැතපුම් භාගයක් පමණ විහිදී යන මුහුදයි.

✶ **26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

26. 1. ඇත් මුළ මහ වනය දෙවනත් කරයි.
2. ගස් පෙළ ඉදිරි වැටෙයි.
3. ඇළ, දොළ, ගංගා මුහුදට ගලා බසිති.
4. සඟ ගණ පිරිත් දෙසයි.

27. 1. ගායකයෝ ගී ගයද්දී අපි අසා සිටියෙමු.
2. සිඟිති දූරිය මා සමඟ සිනාසුනේ ය.
3. සභාවෙන් කෙනෙක් කතාවක් කරන ලදි.
4. තෙරණුවෝ ධර්මය දේශනා කරති.

28. 1. ගංගා ගලා බසිති.
2. අම්මා වැඩ කළේය.
3. නුඹලා එම චාරිකාව ගියෙහු ද?
4. ශිෂ්‍යයන් උදෑසන ම පාසලට යති.

29. 1. ගොවියෝ හෝ කම්කරුවෝ රට සංවර්ධනය කිරීමට මහත් වෙහෙසක් දරති.
2. මහාචාර්ය සරත්චන්ද්‍ර ශ්‍රේෂ්ඨ නාට්‍ය රචකයෙකු වෙයි.
3. ධර්මපාල තුමා අමද්‍යප ව්‍යාපාරයේ පුරෝගාමියෙකු ලූ.
4. ශිෂ්‍යයෝ කැටුව ගුරුවරු සභා ගැබට පිවිසෙති.

30. 1. ගංගාවන් නොනැවතී මුහුදට ගලා බසිති.
2. ඔහුත් ඇයත් තරගය ජය ගනිති.
3. නාවිකයා විසින් සේවකයින්ට අනතුරු හඟවයි.
4. සිසුහු ගුරුවරු හමුවූහ.

## II කොටස

- **1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්න වලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01. කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඔබ පන්තියේදී කරන ලද 'ප්‍රවෘත්ති නිවේදනය' වැඩසටහන ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

    i. ඔබ කණ්ඩායම ඉදිරිපත් කළේ කුමක් සම්බන්ධ ප්‍රවෘත්ති නිවේදනයක් ද?

    ii. නිවේදනය සැකසීමේදී ගුරු භවතා ඔබට ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.

    iii. ප්‍රවෘත්ති නිවේදනය ඉදිරිපත් කිරිමේදි ඔබ විශේෂයෙන් සැලකිල්ලට ගත් කරුණු 3 ක් ලියන්න

    iv. මෙම ක්‍රියාකාරකම තුළ ඔබ ලත් කුසලතා 3 ක් ලියන්න.

    v. ''ප්‍රවෘත්ති නිවේදන'' වැඩසටහන ඉදිරිපත් කිරීමේදි ඔබ මුහුණ දුන් ගැටලු 3 ක් ලියන්න.

    vi. පාසලේදී ඔබට ඉදිරිපත් කළ හැකි ප්‍රවෘත්ති මාතෘකා වර්ග හතරක් ලියන්න.

02. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.

    i. ඩෙංගු උවදුර පිටු දකිමු.

    ii. කොරෝනා වෛසරයෙන් අපේ ජන ජීවිතයට වූ බලපෑම.

    iii. සොබා දහම රැක ගනිමු

    iv. පොත් පත් කියවීමේ අගය

    v. අපෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම්.

03. සිය පිරිවර රටතොට හැම වස්තුව නැති නිම්මා<br>
එද ලොව හැර ඔබ සමගින් තපසට ආවේ මිමා<br>
..........................................................................................<br>
..........................................................................................

    ලපසේ සඳ විලසේ දවසක් වෙන්නුවෙ මිමා<br>
    එප සේ බුදු කෙනෙකුන් මෙන් රැකි දැයි නිති යෙම්මා<br>
    ..........................................................................................<br>
    ..........................................................................................

    i. මෙම කවිවල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

    ii. මෙම පද්‍ය උපුටාගත් මුල් කෘතිය කුමක්ද ?

    iii. කවිවල අලංකාරය වැඩි කිරීම සඳහා යොදාගෙන ඇති උපමා දෙකක් ලියන්න.

04. අතීතයේ ගැමි ජනතාවගේ නිදහස් අව්‍යාජ සිතුම් පැතුම් ධාරාවක දෝංකාරය අපට ඇසිය හැක්කේ ජන කවිය තුළිනි. ජන කවියා උගත් පණ්ඩිතයෙකු නොවන නිසා හෝ තම සිතට ගලා ආ සිතිවිලි මාලාව එක්තරා ගීතවත් ක්‍රමයකට ප්‍රකාශ කළ අන්දම ජන කවි වලින් පැහැදිලි වෙයි. සිංහල ජනතාවගේ සංස්කෘතිය සභ්‍යත්වය ගැන කරුණු සොයන්නෙකුට පවා ජන කවියෙන් උපුටා ගත හැකි කරුණු බොහෝ ය. තමාගේ ජීවිතයේ සතුටු දායක අවස්ථා මෙන්ම දුක්මුසු අවස්ථා ද පිළිබිඹු කිරීමට ගැමි ජනයා කවිය උපයෝගි කර ගැනීම එක්තරා අන්දමකින් ලලිත කලාවක් කෙරේ ඔවුන් තුළ වූ සහජ හැකියාව විදහා පාන්නකි.

i. ජන කවියෙන් පිළිබිඹු වන දේවල් දෙකක් ලියන්න.

ii. ජනකවියෙන් හෙළිවන ගැමියාගේ හැකියාවන් නම් කරන්න.

iii. සිංහල ජනතාව ගැන කරුණු සොයන කෙනෙකුට ජන කවියෙන් දැකගත හැකි දේවල් දෙකක් ලියන්න.

iv. ඡේදයේ දැක්වෙන ලෙස ජන කවියාගේ සිතුම් පැතුම් කෙබඳු ද?

v. පහත සඳහන් වචනවලට ඡේදයෙන් සමාන පද සොයා ලියන්න.

අ. ස්වාධීන -

ආ. කණගාටුදායක -

05. පහත සඳහන් ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''ඔබ බෝසත්වරයෙකි, ඔබට බුදුබව ලැබේවායි ප්‍රාර්ථනා කරමි. දැන් ඉතින් මම ප්‍රීතියෙන් මගේ අවසන්

i. ගමන යා හැකිය''

ii. මෙම ප්‍රකාශය කවුරුන් විසින් කියන ලද්දක්ද?

iii. කා හට කියන ලද්දක් ද?

iv. කුමන අවස්ථාවේ ප්‍රකාශ කරන ලද්දක් ද?

v. මෙම කොටස ඇතුලත් පාඩමේ නම කුමක්ද?

vi. මෙම පාඩම උපුටාගත් මුල් කෘතිය නම් කරන්න.

06. හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරන්න. ('අ' සහ 'ආ' කොටස් දෙකටම පිළිතුරු ලිවිය යුතුයි)

අ. i. අයියාත් අක්කාත් අද දින විදේශගත ................................ (වෙයි/ වෙති)

ii. ළමයි පෙළ ත්‍යාග උත්සවයට ................................ (පැමිණියහ/ පැමිණියේ ය.)

iii. රජතුමාණෝ උයන් කෙළියට ........................................ (යයි/ යති)

iv. සමහරු වැඩිහිටියන් දෙන ඔවදන් හොඳින් .................................. (පිළිගත්හ/ පිළිගත්තේ ය.)

v. සරුංගල් සමූහය අහසේ ඉහළට ඇදී .................................. (යති / යයි)

ආ. පර්යාය පද පහ බැගින් ලියා දක්වන්න.

i. මුහුද -

ii. සතුට

iii. ප්‍රසිද්ධ

iv. සඳ

v. වනය